චක්‍රලේඛ අංක 01/2018

මගේ අංක දපස/සමු.සං/18 ප්‍රා.කාරක සභා.
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් (ද.ප)
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක. 147/3 පෙට්ටිගලවත්ත, ගාල්ල,
2018.03.12 දින.

සියළුම විවිධ සේවා සමූපකාර සමිතිවල,
සභාපති/ලේකම්වරුන් වෙත,

**විවිධසේවා සමූපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා සඳහා සාමාජිකයන් තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම.**

දකුණු පළාතේ සියළු විවිධසේවා සමූපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා සඳහා සාමාජිකයන් තෝරාපත්කර ගැනීම 1977 දෙසැම්බර් මස 28 දිනැති අංක 297/7 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය හා 1992 මාර්තු මස 27 දිනැති අංක 707/14 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නියෝග අනුවද, සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුවද, සිදුකරනු ලැබේ.

02. කාරක සභා සඳහා සාමාජිකයන් තෝරපත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී මෙම නියෝග මාලාවේ 11.3 නියෝගය අනුව ඡන්ද දායකයන්ගේ අනන්‍යතාවය විධිමත් පරිදි තහවුරුකර නොගැනීම තුලින් යම් යම් අක්‍රමිකතා සිදුවන බවට සමූපකාර සමිතිවල සාමාජිකයින්ගෙන් හා මහජන නියෝජිතයින්ගෙන් මා වෙත පැමිණිලි ලැබී ඇත. ඊට විසඳුමක් වශයෙන් කාරක සභා/අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සාමාජිකයන් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම්වලදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන අතර 2018.04.01 වන දින සිට මෙම උපදෙස් පරිදි කටයුතු කල යුතුය.

02. (1) 1977 දෙසැම්බර් මස 28 දිනැති අංක 297/7 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය හා 1992 මාර්තු මස 27 දිනැති අංක 707/14 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නියෝග මාලාවේ 11.3 නියෝගය අනුව ඡන්දදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා උක්ත නියෝග මාලාවේ 5.1 නියෝගය යටතේ "අ" උපලේඛනය අනුව ඉදිරිපත් කලයුතු නාමයෝජනා පත්‍ර සමඟ 03 ඡේදයේ නම්කර ඇති අනන්‍යතා ප්‍රකාශන අතුරින් එක් අනන්‍යතා ප්‍රකාශනයක ඡායා පිටපතක් ඉදිරිපත් කල යුතුය.

03. ගැසට් පත්‍රයේ 11.3 නියෝගය පරිදි ඡන්ද නිලධාරි තැනට/සහකාර ඡන්ද නිළධාරි තැනට ඡන්ද දායක ලැයිස්තුවේ නම සඳහන් ඕනෑම කෙනකු විසින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛණ වලින් එකක් ඉදිරිපත්කර ඡන්ද පත්‍රිකාව ලබා ගැනීමට කටයුතු කල යුතුය.

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති හැඳුනුම්පත
II. වලංගු මෝටර්රථ පැදවීමේ බල පත්‍රය,
III. වලංගු විදේශ ගමන් බල පත්‍රය,
IV. විශ්‍රාමික හැඳුනුම් පත.
V. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පූජ්‍ය පක්ෂය සඳහා නිකුත් කර ඇති හැඳුනුම්පත.
VI. ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කර සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති වැඩිහිටි හැඳුනුම් පත.
VII. ගොවි හැඳුනුම් පත
VIII. සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් විසින් නිකුත්කරන තාවකාලික හැඳුනුම්පත .

ඉහත පරිදි අනන්‍යතා ලේඛණ ඉදිරිපත් නොකරන කිසිවකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකරන අතර ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව නොලැබෙනු ඇත.

04. මෙම ගැසට් පත්‍රයේ 2.1 නියෝගය අනුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ඇති සාමාජිකයන්ගේ ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත හැඳුණුම් පත පරිදි ඡන්දදායක ලැයිස්තුවේ නම සඳහන් විය යුතු බවද, එසේ නොවන අවස්ථාවලදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව නොලැබෙන බවද, සාමාජිකයන් දැනුවත් කල යුතුය.

05. ඉහත 03. වන ඡේදයෙන් දක්වා ඇති I සිට VII දක්වා අනන්‍යතා ප්‍රකාශන අතුරින් තම අනන්‍යතාවය ප්‍රකාශ කල නොහැකි සමූපකාර සමිති සාමාජිකයන්ට සමූපකාර සංවර්ධන කොමසාරිස් /රෙජිස්ට්‍රාර් වෙතින් තාවකාලික හැඳුනුම්පතක් ලබා ගත හැකිය. ඒ සඳහා මෙයට යාකර ඇති ආකෘතිය අනුව මාස හයක (06) කාලයක් තුල ලබාගත් උඩුකය සහිත පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් සමඟ සකස්කරගත් අයදුම් පත්‍රයක් සාමාජිකයා පදිංචි වසමේ ග්‍රාම නිළධාරි, ප්‍රදේශීය ලේකම්, අදාල සමිතියේ ලේකම් සහ සමිතිය භාර ස.සං.ප්‍රා.නි හා අදාල දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත්කල යුතුය.

06. සමිතියේ සාමාජිකත්වය ලබාගෙන ඇති සමිති බල ප්‍රදේශයේ තුල රැකියාවක නියුතු හා නිශ්චල දේපල ඇති අය තාවකාලික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා තමා ස්ථිර පදිංචිව සිටින ලිපිනය අයත් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා ප්‍රදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව ඉහත අංක 05 පරිදි අයදුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත්කල යුතුය

07. මෙම තාවකාලික හැඳුනුම් පත සඳහා වූ ඉල්ලුම්පත් සමිතියේ ඡන්ද විමසීමට මාස 03 කට පෙර සිට නාමයෝජනා භාරගන්නා දිනට දින 14 පෙර දින තෙක් පමණක් මෙම කාර්යාලයට භාරගන්නා අතර අයදුම් පත ලැබී සතියක් ඇතුලත තාවකාලික හැඳුනුම් පත එහි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවනු ලැබේ.

එන්.ඒ.කේ.එල්.විජේනායක
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්.
දකුණු පළාත.

පිටපත්:-

1. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, ගාල්ල දිස්ත්‍රික්කය/මාතර දිස්ත්‍රික්කය/ හම්බන්තොට දිස්ත්‍රික්කය - මේ පිළිබඳ විවිධ සේවා සමුපකාර සමිති වල අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කර උක්ත උපදෙස් පරිදි කටයුතු කිරීමට මග පෙන්වීම සහ සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කර, උක්ත උපදෙස් පරිදි සියළුම ලියාපදිංචි කරන ලද විවිධ සේවා සමූපකාර සමිති වල ප්‍රාදේශික කාරක සභා සාමාජිකයන්/ මහා සභා සාමාජිකයන් හා අධ්‍යක්ෂ මණ්ඩල (කාරක සභා) සාමාජිකයන් තෝරාපත්කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා.
2. ලේකම්, විවිධ සේවා සමුපකාර සමිති - 2018.04.01 දින සිට ඉහත උපදෙස් පරිදි කටයුතු කිරීම සඳහා සහ ප්‍රාදේශික කාරක සභා සහ සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා.
3. ගරු සභාපති හා ලේකම්, ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල - තම සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා.
4. සියළුම සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් - ඉහත උපදෙස් පරිදි කටයුතු කිරීම සඳහා

<u>තාවකාලික හැඳුනුම්පත්‍රය</u>

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (දකුණු පළාත)

ඡායාරූපය

(ග්‍රාම නිලධාරි අනු අත්සන තබා නිළමුද්‍රාව තැබීම අවශ්‍යය)

i. අයදුම්කරුගේ සම්පූර්ණ නම:......................................................

..........................................................................................

ii. ලිපිනය:...............................................................................

iii. ග්‍රාම නිලධාරි වසමේ නමහා අංකය:...........................................

iv. සමුපකාර සමිතිය:..................................................................

v. ප්‍රාදේශික කාරක සභාවේ නම හා අංකය:.......................................

ඉහත තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

........................... ...............................

අයදුම්කරුගේ අත්සන දිනය

.......................................................................... මයා/මිය/මෙනවිය

අංක..........................................................................දරණ ග්‍රාම නිලධාරි

වසමේ පදිංචිකරුවකු බව සනාථ කරමි.

................................ ........................

ග්‍රාම නිලධාරි (අත්සන හා නිළමුද්‍රාව) දිනය

ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන

................................ ........................

ප්‍රාදේශීය ලේකම් (අත්සන හා නිළමුද්‍රාව) දිනය

.............................................................................මයා/මිය/මෙනවිය

සී/ස..........................................විවිධ සේවා සමුපකාර සමිතියේ අංක

.............................. දරණ.............................................:ප්‍රාදේශිකයේ

ජනද හිමි සාමාජික නාම ලේඛණයේ අංක ........................ යටතේ

සඳහන්ව ඇති බව සහතික කරමි.

.............................. ........................................

සමිතියේ ලේකම් ස.සං.ප්‍රා.නි.

(අත්සන හා නිළමුද්‍රාව හා දිනය) (අත්සන හා නිළමුද්‍රාව හා දිනය)

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් අනු අත්සන

.................................................... ........................

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් දිනය

(අත්සන හා නිළමුද්‍රාව)

.................................................... ........................

සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් දිනය

(අත්සන හා නිළමුද්‍රාව)